කීර්ති වර්ණකුලසූරිය

සී. විග්නේෂ්වරම් මහ ඇමැති ධුරය දරන උතුරු පළාත් සභාව යෝජනා 321 ක් සම්මත කිරීමෙන් ගිනස් වාර්තාවක් තබා ඇත.

2013 දී ආරම්භ වූ උතුරු පළාත් සභාව මේ වනවිට සැසිවාර 81 ක් පවත්වා ඉහත... 04-පිටුව

# ආණ්ඩුව දුර්වල වනවිට ඒකාබද්ධය හිරේ දානවා

## - මහින්ද රාජපක්ෂ

නෝමන් පලිහවඩන



ආණ්ඩුව දුර්වල වෙන හැම අවස්ථාවකදීම ඒ අය කරන්නේ ඒකාබද්ධ විපක්ෂයේ අය හිරේ දාන එක යැයි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 'දිවයින'ට ඊයේ (20 වැනිදා) පැවැසීය.

ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරීන් අත්අඩංගුවට පත්වීම පිළිබඳව කළ විමසීමකදී රාජපක්ෂ මහතා... 04-පිටුව

හේමන්ත රන්දුනු

මාලබේ පෞද්ගලික විශ්වවිද්‍යාලය අහෝසි කරන ලෙස ඉල්ලමින් කොළඹ කොල්ලුපිටියේදී උද්ඝෝෂණ ව්‍යාපාරයක නිරත වෙමින් සිටියදී අත්අඩංගුවට ගත් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ භික්ෂූන් වහන්සේ සිව් නමක් ඇතුළු හත්දෙනකු ලබන 02 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මෙනෙවිය ඊයේ (20 වැනිදා) නියෝග කළාය. 04-පිටුව

# ප්‍රදේශ කීපයකට වැසි වැටෙයි



පවතින නියං තත්ත්වය හමුවේ යම් අස්වැසිල්ලක් එක්කරමින් ඊයේ (20 වැනිදා) දිවයිනේ ප්‍රදේශ කීපයකට සිහින් වර්ෂාපතනයක් ඇතිවූ බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි. 04-පිටුව

## දෙව් මැදුර අද පත්‍රයේ

# ආනයනික සහල් කිලෝවක් රුපියල් 76කට වඩා වැඩි මිලකට විකිණීම තහනම්

## ජනපති අවධාරණය කරයි

ආනයනය කරන සහල් කිලෝග්‍රෑම් 01 ක් රු. 76 කට වඩා වැඩි මිලකට වෙළෙඳපොළේ අලෙවි කළ නොහැකි බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අවධාරණය කර සිටී.

ජනාධිපතිවරයා මේ බව ප්‍රකාශ කළේ මතුවිය හැකි නියං තත්ත්වය හමුවේ ජනතාවට සහන සැලසීමට සහ රජයේ සැලසුම් ... 04-පිටුව

# ටෙලිකොම් ඉල්ලා වර්ජනය කරන 'මැන් පවර්' සේවකයන්ට වාරණයක්

ඒ. ජේ. ඒ. අබේනායක

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ස්ථිර සේවයට බඳවා ගන්නා ලෙස ඉල්ලමින් මැන් පවර් සේවකයින් විසින් පසුගිය 26 වැනිදා සිට සිදුකරන අඛණ්ඩ වැඩවර්ජනය වළක්වමින් කොළඹ දිසා විනිසුරු සුජීව නිශ්ශංක මහතා ඊයේ (20 දා) වාරණ නියෝගයක් නිකුත් කළේය. 04-පිටුව

# පී.එච්.අයි. අල්ලස් දැලේ

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

මහනුවර තැන්නේකුඹුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් රුපියල් දස දහසක අල්ලසක් ලබාගනිද්දී ඊයේ (20 දා) පෙරවරු 11.00 ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගන්නා ලදී. 04-පිටුව

# එච්.අයි.වී. ආසාදිතයාගේ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කිරීමට අවසර

ඒ. ජේ. ඒ. අබේනායක

එච්.අයි.වී. ආසාදිතයකුට ලබාදුන් රැකියාවක් එකී රෝගී තත්ත්වය නිසා අහිමි කිරීමට ගුවන් සේවා සමාගමක් ගත් තීරණයට එරෙහිව ගොනුකර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (20 දා) අවසර ලබා දුන්නේය. 04-පිටුව

# උතුර අවුල් වෙන්නේ මධ්‍යම රජය දුරස් නිසයි

## විකල්පයක් දෙන්න

## ෆයිසර් මුස්තාපාගෙන් විග්නේෂ්වරන් ඉල්ලීමක් කරයි





දිනසේන රතුගමගේ

උතුරු පළාත් සභාව තුළ ගැටලු සහගත තත්ත්වයක් හටගෙන ඇත්තේ මධ්‍යම රජය උතුරු පළාත් සභාව සමග ඇති දුරස්ථභාවය නිසා බව සඳහන් කළ සී. වී. විග්නේෂ්වරන් ප්‍රධාන ඇමැතිවරයා ඊට ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග අනුගමනය කරන මෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා ඇමැතිවරයාගෙන් ඉල්ලීමක් කොට තිබේ.

ෆයිසර් ඇමැතිවරයා යාපනයට ගිය අවස්ථාවේදී 19 දා සවස ප්‍රධාන ඇමැතිවරයා මෙම ඉල්ලීම කර තිබේ. 04-පිටුව

# සරත් කුමාර ගුණරත්නට ඇප

සමන්ත ඉලේපෙරුම

ඉකුත් ජනාධිපතිවරණ සමයේදී මීගමු කළපු සංවර්ධන ව්‍යාපාති සමාරම්භක උළෙල සඳහා රුපියල් ලක්ෂ 112 ක මුදලක් සාපරාධී සාවද්‍ය ලෙසින් පරිහරණය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි හිටපු නියෝජ්‍ය ධීවර ඇමැති සරත් කුමාර ... 04-පිටුව

# ගුවන් යානා ගනුදෙනුව අවලංගු නොකළා නම් කෝටි 4320 ක් පාඩුයි

## - ඇමැති කබීර් හෂීම්

ශ්‍යාම් නුවන් ගනේවත්ත

ඒ 350 ගුවන් යානා හතරක් මිලදී ගැනීමේ ගනුදෙනුව අවලංගු නොකළා නම් අදාළ ගිවිසුම් කාලයේදී රු. කෝටි 4320 ක අති විශාල අලාභයක් සිදුවීමට ඉඩ තිබුණ බවද, වත්මන් රජය කළේ එම අති විශාල පාඩුව සිදුවීම වළක්වා ගැනීම ... 04-පිටුව


